
# උගුලට අසුවුන ඌරු පැටියා



R.M. දුලිති නවීශා රත්නායක

කෘතියේ නම - උගුලට අසුවුන ඌරු පැටියා

ප්‍රථම මුද්‍රණය - 2024.12.15

කතාව සහ චිත්‍ර - R.M. දුලිති නවීශා රත්නායක

කතෘගේ ලිපිනය - නො. 24, බෝධිරාජ මාවත,
බූවැලිකඩ, මහනුවර

පාසල - ම/මහාමායා බාලිකා විදුහල

ශ්‍රේණිය - 2 ශ්‍රේණිය B

පරිගණක අක්ෂර හා පිටු සැකසුම - A2 Collection
නො. 23, 24
ටොරින්ටන් පටුමග,
මහනුවර.

ISBN අංකය - 978-624-208-292-9

# පිදුම

මාගේ ආදරණීය

මහාමායා බාලිකා මාතාවට

මා විසින් නිම කළ

මෙම කථා පුවත

ආදරයෙන්

පුදමි.

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය
ශෂිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඔන්න එකමත් එක කාලෙක හිටියා බට්ටි, ටිකිරි කියලා ළමයි දෙන්නෙක්. බට්ටි කියන්නේ නංගී. ටිකිරි කියන්නේ අයියා.



ඉතිං ඒ දෙන්නා කැමති ගස්වල ගෙඩි කඩාගෙන කන්න



හැමදාම මේ දෙන්නගෙ වැඩේ මොනවාහරි පලතුරු කඩාගෙන කන එක.



ඔන්න එක දවසක් බට්ටි ජම්බු ඕන කියලා අයියට කිවුවා. ඊට පස්සේ ටිකිරි ජම්බු ගහ ළඟට ගිහින් ජම්බු අත්තකට ගැහුවා. ජම්බු ටික වැටුණේ පහළ කැළේට.

වැටුණු ජම්බු ටික අහුලා ගන්න දෙන්නම පහළට බැස්සා. එහෙම යනකොට ඒ දෙන්නා දැක්කා ලස්සන මල් ගහක්.





ඉතිං බට්ටිට ඒකෙන් මලක් ඕනවුණා. මල් කඩන්න හිතාගෙන ගහ ළඟට ගියා. අනේ මද්දකට අහුවුණ ඌරු පැටියෙක්. එයා පව් ටිකිරි කිවුවා.

එයාලා දුවගෙන ඇවිත් මේ බව තාත්තාට කිවුවා.

ටිකිරි :- තාත්තේ පහළ වත්තේ ඌරු පැටියෙක් මද්දකට අසුවෙලා.



තාත්තා :- ඇත්තද? ඒක ඔයාලා මට ඇවිත් කියපු එක හොඳයි. ඌරෝ බේරන එක පරිස්සමට කරන්න ඕන දෙයක් තාත්තා කිවුවා.



බට්ටිටයි, ටිකිරිටයි උඩ ඉදලා බලන් ඉන්න කියලා තාත්තා ගහක් උඩට නැග්ගා.



දිග කොක්කක් දාලා මද්ද කැපුවා.



අනේ පව් ඌරු පැටියා සතුටින් දුවගෙන ගියා.



එතකොට කැලෑ රොදේ ඉඳලා පැටියාගේ අම්මත් පස්සෙන් දුවගෙන ගියා.





ඉතිං ඌරු පැටියව බේරගත්ත තාත්තටයි, ටිකිරිටයි, බට්ටිටයි ගොඩක් සතුටුයි. එයාලට ලොකු පිනක් කරගන්න ලැබුණා.

ඔන්න යාළුවනේ සතෙකුට කරදරයක් වුණාම අපිත් උදවු කරන්න ඕනේ.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්